## මහාචාර්ය කාලෝස් සෙල්ඩ(ර්)න්



නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි. රචකයෙකි.නාට්‍ය අධ්‍යාපනඥයෙකි.

කියුබාවේ හාවානා නුවර ජීවත්වෙමින් ලෝක ව්‍යාප්තව රංග කලාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන සම්මානනීය නාට්‍ය කරුවෙකු ලෙස මොහුව හඳුන්වා දිය හැක.

1963 දී හවානා හි උපත ලද කාලෝස් ප්‍රාසංගික කලා අධ්‍යයනය වෙනුවෙන් හවානාහි කලා අධ්‍යයනය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනයෙන් ගෞරව උපාධිය 1986 දී ලබාගෙන ඇත.තම උසස් අධ්‍යාපන කටයුතු වලින් පසු නේවාසික උපදේශක වශයෙන් හවානාහි පිහිටි බෙන්ඩියා රංග ශාලාවේ කටයුතු කර ඇත.1996 වන තෙක් මෙම රංග ශාලාවේ කටයුතු කළ මොහු 1996 දී ආගෝස් නමින් නාට්‍ය කණ්ඩායමක් බිහි කළේය.එය මේ වන විට ලෝක මට්ටමේ අවධානය දිනා ගත් නාට්‍ය කණ්ඩායමකි. සම්භාව්‍ය යුරෝපීය නාට්‍ය සමකාලීන ලතින් ඇමරිකානු නාට්‍ය පරිවර්තන මෙන්ම ස්වතන්ත්‍ර කෘති මෙම නාට්‍ය කණ්ඩායම විසින් නිර්මාණ කරන ලද අතර කාලෝස්ගේ නිර්මාණ ප්‍රභාව මෙම නාට්‍ය නිර්මාණ සමඟ ලොව පුරා පැතිර ගියේය.2011 වසරේ දී හෙතෙම ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් හි පිහිටි රේ ජුවන් කාලෝස් විශ්ව විද්‍යාලයෙන් තම ශාස්ත්‍රපති උපාධිය දිනා ගෙන ඇත.

ලතින් ඇමරිකානු ප්‍රේක්ෂක සමූහය වෙත බ්‍රෙෂ්ට්, බෙකට්, ඉබ්සන් ස්ට්‍රින්ඩ්බර්ග් වැනි නූතන යුරෝපීය නාට්‍යකරුවන්ගේ නාට්‍ය නිර්මාණ ළඟා කරවීමේ ගෞරවය කාලෝස් ප්‍රමුඛ ආනෝස් නාට්‍ය කණ්ඩායමට හිමි වේ.එමෙන්ම ගොන්සාලේස් මේලෝ වැනි සමකාලීන රචකයන්ගේ නාට්‍ය රචනා නිෂ්පාදනය කරමින් කියුබානු නූතන රංගය වෙත ලෝක අවධානය රැගෙන ඒමට සමත් විය.කියුබාවේ ප්‍රචලිත ප්‍රමුක රංග කණ්ඩායම් සමඟ එක්ව කටයුතු කරමින් විවිධ සංස්කෘතීන් නියෝජනය කරන නාට්‍ය කණ්ඩායම් සීමා මායිම් වලින් තොරව රාශීභූත ආගෝස් රංග සාමුහිකය කටයුතු කර ඇත.සියලු කණ්ඩායම් වල එකතුවෙන් අරඹන ලද රූපණ පර්යේෂණාගාරය ප්‍රාසාංගික කලාව වෙනුවෙන් පොදු භාෂාවක් තනා ගැනිමට ප්‍රයන්ත දරා ඇත.

ආගෝස් නාට්‍ය කණ්ඩායම ලෝක අවධානය දිනා ගත් නාට්‍ය වනුයේ කාලෝස් විසින් රචනා කර අධ්‍යක්ෂණය කරනු ලැබු ලක්ෂ සීයය (Ten Million) නම් වේ. මෙම නිර්මාණය ලෝක මට්ටමින් ප්‍රේක්ෂක විචාරක අවධානය හා සම්භාවනාව දිනා ගෙන ඇත.

මෙම නාට්‍ය කණ්ඩායමේ නවතම කෘතිය වන්නේ "අභිරහස හා කුඩා කොටස්" නිෂ්පාදනයයි. මෙය රචනා කර අධ්‍යක්ෂණය කර ඇත්තේ ද, මහාචාර්ය කාලෝස් සෙල්ඩ(ර්) විසිනි.මෙම නිර්මාණයද ප්‍රේක්ෂක විචාරක සම්භාවනාවට පාත්‍ර වුවකි.

පරිවර්තන සටහන: සම්පත් පෙරේරා

**Carlos CELDRÁN**’s profile translated in to Sinhala by Mr,Sampath Perera (Assistant Director - Education, Research and Conservation) Tower Hall Theatre Foundation, National Centre of ITI, Sri Lanka